# උපාදාන නිරෝධ කරන පිළිවෙත නොදන්නා භික්ෂුව පැවිද්දෙක් යැයි සම්මත නොවෙයි

## සමණබ්‍රාහ්මණ සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, සංයුක්ත නිකාය 2 - පිටු අංක 24 - 27)

යම් මහණ බමුණෙක්,

- උපාදානය මැනවින් නොදනිත් ද
- උපාදාන සමුදය මැනවින් නොදනිත් ද
- උපාදාන නිරෝධය මැනවින් නොදනිත් ද
- උපාදාන නිරෝධ ගාමිනී ප්‍රතිපදාව මැනවින් නොදනිත් ද

ඒ මහණ බමුණෝ, මහණුන් කෙරෙහි මහණ යැයි සම්මත ද නොවෙති. බමුණන් කෙරෙහි බමුණු යැයි සම්මත ද නොවෙති.

ඒ මහණ බමුණෝ, පැවිද්දන්ගේ පැවිදි බවෙහි අර්ථයත්, බමුණන්ගේ බමුණු බවෙහි අර්ථයත් මේ ජීවිතයේ දී මනා ව අවබෝධ කොට ප්‍රත්‍යක්ෂ කොට වාසය ද නොකරති.

- උපාදානය යනු;

  තදින් අල්ලා ගැනීම වෙයි. උපාදාන සතරකි

  කාම උපාදානය

  දිට්ඨි උපාදානය

  සීලබ්බත උපාදානය

  අත්තවාද උපාදානය

- උපාදාන සමුදය යනු;

  තණ්හාව හටගැනීමෙන් උපාදානය හටගනියි.

- උපාදාන නිරෝධය යනු;

  තණ්හාව නිරෝධයෙන් උපාදානය නිරෝධ වෙයි.

- උපාදාන නිරෝධ ගාමිනී ප්‍රතිපදාව යනු;

  ආර්ය අෂ්ටාංගික මාර්ගය වෙයි.

  එනම් සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති සහ සම්මා සමාධි වෙයි.